(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(3).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 මැයි 23 සිකුරාදා**

**2025 ජූනි 03 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— දූෂණ විරෝධී පනත යටතේ නියෝග,— 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 සහ 92 වගන්ති සමඟ කියවිය යුතු 156 වගන්තිය යටතේ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ උපදෙස් මත අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 මාර්තු 20 දිනැති අංක 2428/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.05.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2025 ජූනි 6 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් ණය වින්දිතයින් බවට පත් වූ පුද්ගලයින්හට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් පිරිසෙන් අති බහුතරයක් මේ වනවිට ණය වින්දිතයින් බවට පත්ව සිටින බැවින්, එම පිරිසට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— පළාත් පාලන ආයතන තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා කළ තැනැත්තන්ට එරෙහිව පියවර ගැනීම,— ශ්‍රී ලංකාව පුරා පිහිටි සියලුම පළාත් පාලන ආයතනයන්හි පසුගිය කාලය තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා වීම සම්බන්ධව කඩිනමින් පරීක්ෂණ පවත්වා ඒ සඳහා දායක වූ සියලුම බලධාරීන්ට පවත්නා නීතිය අනුව දඬුවම් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2025 ජූනි 17 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

279/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෙටි පණිවුඩ සේවාව (SMS) මාර්ගයෙන් විදුලි බිල්පත් ලබා දීම ආරම්භ කර මේ වනවිට ගත වී ඇති කාලය කොපමණද;

(ii) මේ වනවිට සියලුම විදුලි පාරිභෝගිකයන් කෙටි පණිවුඩ සේවාව සඳහා ලියාපදිංචි වී තිබේද;

(iii) නොඑසේ නම්, මේ වනතෙක් ලියාපදිංචි වී නොමැති විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සේවාව සඳහා ලියාපදිංචි වීමට නොහැකි හා ජංගම දුරකථන නොමැති විදුලි පාරිභෝගිකයන් සඳහා විදුලි බිල්පත් ලබා දීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

307/2024

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක් එක් දිස්ත්‍රික්කය තුළ පිහිටි ජාතික හා පළාත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල සේවයේ නියුතු මුළු ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සඳහා වැටුප් හා පාරිශ්‍රමික වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මාසිකව හා වාර්ෂිකව වැය වන මුළු මුදල කොපමණද;

(iv) රජයේ ගුරුවරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ පාසල් තුළ ගුරු හිඟයක් පවතින්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා වූ කාලසටහන කවරේද;

(iii) ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100ට වඩා අඩු සංඛ්‍යාවක් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නාමයන් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහ තුළ රජයේ පාසල්වල 1 ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) මීළඟ වර්ෂ පහ තුළ 1 ශ්‍රේණියට ඇතුළත් වෙතැයි පුරෝකථනය කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න තවදුරටත් එතුමිය වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

452/2025

ගරු ටී. කේ. ජයසුන්දර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගිං ගඟ පිටාර ගැලීම හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවිතවලට හා දේපලවලට විශාල බලපෑමක් ඇති කරන බව පිළිගන්නේද;

(ii) 2000 වර්ෂයෙන් පසු ගිං ගඟේ පිටාර ගැලීම පාලනය කිරීම සඳහා හෝ වෙනත් අරමුණක් සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්තා සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වාර්තා කවරේද;

(iv) එම වාර්තා සකස් කරන ලද ආයතන කවරේද;

(v) එම ව්‍යාපෘති වාර්තා/ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(vi) ඒ සඳහා ප්‍රතිපාදන ලබා ගත් ප්‍රභවයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගිං ගඟේ පිටාර ගැලීම පාලනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය, අවසන් කරන ලද වර්ෂය, වෙන් කරන ලද මුදල, වියදම් කරන ලද මුදල, ක්‍රියාත්මක කරන ලද ආයතනය සහ ලැබී ඇති විසඳුම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

456/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂය තුළ ශ්‍රී ලංකාවට පැමිණෙතැයි ඉලක්ක කර ඇති විදේශීය සංචාරකයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) විදේශීය සංචාරකයන් පැමිණෙන බවට අපේක්ෂිත රටවල් කවරේද;

(iii) එම සංචාරකයන් සඳහා අවශ්‍ය නවාතැන්/කාමර පහසුකම් ප්‍රමාණවත් පරිදි තිබේද;

(iv) කොවිඩ්-19 වසංගතය, පාස්කු ප්‍රහාරය සහ අරගලය වැනි හේතු මත කඩා වැටුණු ශ්‍රී ලංකාවේ සංචාරක හෝටල් ක්ෂේත්‍රයේ දියුණුව සඳහා ගනු ලබන පියවර කවරේද;

(v) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නඟා සිටුවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(vi) ශ්‍රී ලංකාවේ ඇති සංචාරක කලාප සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

569/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට නැවත පැමිණ සේවය කළ යුතුය යන දැඩි කොන්දේසිය යටතේ විදේශීය විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධිය හෝ වෙනත් වැඩිදුර අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ජනාධිපති අරමුදල මඟින් මුදල් ලබාදී ඇති බව දන්නේද;

(ii) ඒ යටතේ හිටපු ජනාධිපතිවරුන්ගේ, ඇමතිවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ දරුවන්ට, ඥාතීන්ට සහ හිතවතුන්ට 2005 වර්ෂයට පසුව ජනාධිපති අරමුදල මඟින් මුදල් ලබාදී තිබේද;

(iii) එසේ නම්, එසේ මුදල් ලබාදී ඇති පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ දේශපාලඥයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත පුද්ගලයන් අතරින් ආචාර්ය උපාධිය අවසන් කර ශ්‍රී ලංකාවට නැවත පැමිණ ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ ශ්‍රී ලංකාවට නැවත පැමිණ නැති පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාවට නැවත පැමිණ නැති පුද්ගලයන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(vii) ඔවුන් වෙනුවෙන් රජය විසින් වැය කරන ලද මුදල් අය කර ගෙන තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

586/2025

ගරු අජිත් ගිහාන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහපොළ භාරකාර අරමුදලට අරමුදල් රැස්කිරීම වෙනුවෙන් ආරම්භ කරන ලද මහපොළ අධ්‍යාපනික සහ වෙළඳ ප්‍රදර්ශනය අවසන් වරට පවත්වනු ලැබූ දිනය, ස්ථානය සහ ඒ සඳහා වියදම් කරන ලද මුදල කවරේද;

(ii) මහපොළ භාරකාර අරමුදලේ මේ වනවිට පවතින ප්‍රාග්ධන වත්කම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

802/2025

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී විවිධ ගැටලු පැන නැඟී ඇති බවත්;

(ii) අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන් ඉඩම් හිමිකරුවන් විශාල පිරිසකට මේ දක්වා වන්දි ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන්ට ගෙවීමට නියමිත වන්දි මුදල් ගෙවීම සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) දීර්ඝ කාලයක් තිස්සේ එම වන්දි මුදල් ලබා දීම ප්‍රමාද වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, එම වන්දි මුදල් ගෙවීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

837/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු ප්‍රාදේශීය වැඩපළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ, මැදවච්චිය ප්‍රාදේශීය වැඩපළ තුළ ටයර් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට යෝජනා කර තිබූ බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා වෙන් කර තිබූ මුදල කොපමණද;

(v) 2025 පෙබරවාරි 28 වන දිනට එහි ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

847/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් එම කොමිෂන් සභාවේ සේවකයන් වෙත විශේෂ වරප්‍රසාද යටතේ ඉඩම් බැහැර කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එලෙස ඉඩම් ලබාදී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඊට අදාළ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන් වෙත විශේෂ වරප්‍රසාද යටතේ ඉඩම් බැහැර කිරීමේ නෛතික පදනම කවරේද;

(v) එලෙස බැහැර කරන ලද ඉඩම්, වෙනත් පාර්ශ්ව වෙත විකිණීමට හෝ පැවරීමට හැකියාවක් තිබේද;

(vi) විශේෂ වරප්‍රසාද යටතේ ලැබුණු ඉඩම් අතරින් වෙනත් පාර්ශ්ව වෙත විකුණා හෝ පවරා ඇති ඉඩම් සංඛ්‍යාව කොපමණද;

(vii) එම ඉඩම්, වෙනත් පාර්ශ්ව වෙත විකිණීම හෝ පැවරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

875/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාලසීමාවේදී මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු (Deed of Grant) හෝ ඉඩම් බලපත්‍ර (Land permit) ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචි වී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා දී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජුනි 18 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

515/2025

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මියගිය ජනතාව සිහිකිරීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ජාලා තුළ රජය අපකීර්තියට පත්වන ආකාරයේ ප්‍රචාර සිදු කරන ලද බව දන්නේද;

(ii) සමාජ මාධ්‍ය ජාලා තුළ සංවිධානාත්මක ආකාරයෙන් ජාතිවාදය, ආගම්වාදය සහ ද්වේශ සහගත ප්‍රකාශ සිදු කිරීමට එරෙහිව මේ වනවිට බලපැවැත්වෙන නීතිමය ප්‍රතිපාදන කවරේද;

(iii) ඒ අතරින් පසුගිය කාලයේදී වැඩි වශයෙන් යොදා ගෙන ඇති පනත් කවරේද;

(iv) මාධ්‍ය මඟින් අසත්‍ය කරුණු ප්‍රචාරය වීමෙන් පසු ඒ සම්බන්ධයෙන් නිවැරදි සත්‍ය තත්ත්වය පිළිබඳව රජය විසින් කරනු ලබන පැහැදිලි කිරීම කඩිනමින් ප්‍රචාරය නොවීම හේතුවෙන් ඇති වන අපකීර්තිය වැළැක්වීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(v) මෙම තත්ත්වය නිවැරදි කිරීමට සහ ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් නැවත ඇති නොවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

613/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ළඟම පාසල-හොඳම පාසල ව්‍යාපෘතිය' යටතේ මධ්‍යම පළාතේ රජයේ පාසල්වල ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති සහ වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

633/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයේදී සිදු වී ඇති වංචා, දූෂණ සහ ඝාතන සම්බන්ධයෙන් දේශපාලකයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව වර්ෂ 2020 සිට 2024 දක්වා කාලය තුළ නීතිපති දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට නඩු කටයුතු අවසන් වී ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් නඩු අතරින් නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම නඩු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

636/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම, පාලවිය සිට අරුවක්කාරු හුණුගල් කොරිය වෙත හුණුගල් ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින්, මැදිරි සහ වෙනත් උපාංග බදු පදනම මත ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඉහත උපකරණ බදු පදනම මත ලබා ගන්නා ලද සමාගමේ නම කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම උපකරණ බදු පදනම මත ලබා දීමෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත බදු ගිවිසුම කාලීන අවශ්‍යතා මත නැවත සමාලෝචනය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

650/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(ii) එය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iii) මේ වනවිට එම ඖෂධ තත්ත්ව පාලන පරීක්ෂණාගාරය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ආනයනික ඖෂධ වැඩි ප්‍රමාණයක් නිසි තත්ත්ව පරීක්ෂාවකට භාජනය නොවන බව දන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්ව පාලන පරීක්ෂණාගාරය නිසි පරිදි යාවත්කාලීන කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

715/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුකුළේගඟ විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම ආරම්භ කරන ලද කාල වකවානුව කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම විදුලි බලාගාරයේ ප්‍රවේශ මාර්ගය සම්බන්ධයෙන් දැනුම්වත් වී තිබේද;

(ii) එම ප්‍රවේශ මාර්ගයේ ආරම්භක ස්ථානය සහ අවසාන ස්ථානය කවරේද;

(iii) ඉහත ප්‍රවේශ මාර්ගයේ මාර්ග අංක 437 දරන බස් රථය ධාවනය වන අතර එම මාර්ගය පොදු ප්‍රවාහන මාර්ගයක් බවට පත් වී ඇති බව දන්නේද;

(iv) එම මාර්ගයේ කුකුළේගඟ විදුලි බලාගාරයට අයත් වන කොටසේ දුර කොපමණද;

(v) නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් එම මාර්ග කොටසේ අර්ධයකට ආසන්න ප්‍රමාණයක් අනාරක්ෂිතභාවයට පත් වී ඇති බව දන්නේද;

(vi) එම මාර්ග කොටස නිසි පරිදි නඩත්තු කිරීම සඳහා පියවර ගන්නේද;

(vii) නොඑසේ නම්, එම මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

724/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'සුව සැරිය' ගිලන් රථ සේවය මඟින් ඉතා විශිෂ්ට සේවයක් සිදු වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගිලන් රථ සේවය තවදුරටත් ශක්තිමත් කිරීමට සහ පුළුල් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

792/2025

ගරු සුජීව දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට වාහන ආනයනය නතර කර තිබූ කාලසීමාව තුළදී, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලපත්‍රලාභී බස්රථ හිමියන්ගේ ධාවනයට නුසුදුසු බස්රථ විකිණීමෙන් පසු, නව බස්රථයක් මිල දී ගැනීමට බස්රථ ආනයනය ආරම්භ කරනතුරු සිටීමට සිදු වූ බවත්;

(ii) ඉහත කාලසීමාවේදී, එම බස්රථ හිමියන් විසින් ධාවන බලපත්‍ර කොමිෂන් සභාවට භාර දී තිබූ බවත්;

(iii) බස්රථ ආනයනය ආරම්භ කිරීමෙන් පසු නව බස්රථ ධාවනයට යෙදවීමේදී, පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 'චාට් ශීට්' නිකුත් කිරීමට ධාවනය නොකළ කාලසීමාව සඳහා ද හිඟ මුදල් අය කරන බවත්;

(iv) බස්රථ ආනයනය නතර කර තිබූ කාලයේදී, බස්රථ මිලදී ගැනීමට නොහැකි වීමෙන් නව බස්රථ ධාවනයට යෙදවීමට නොහැකි වූ බවත්;

(v) එබැවින්, බස්රථ සඳහා 'චාට් ශීට්' නිකුත් කිරීමේදී, ධාවනය නොකළ කාලසීමාව සඳහා හිඟ මුදල් අය කිරීම අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ලබා දෙන විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

848/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිනුවන්ගොඩ නගර සභාවට අයත්, 'නව වෙළඳ සංකීර්ණය' නමින් හඳුන්වන වෙළඳ සංකීර්ණයක් මිනුවන්ගොඩ නගරයේ තිබෙන බව දන්නේද;

(ii) එහි ඇති වෙළඳ කුටි (කඩ කාමර) සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් වෙළඳ කුටිය බදු පදනම මත ලබා ගෙන ඇති පුද්ගලයාගේ නම, ලිපිනය සහ අය කරනු ලබන මාසික හෝ වාර්ෂික කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සංකීර්ණයේ වෙළඳ කුටි බදු පදනම මත ලබා ගත් පුද්ගලයන්ට එම වෙළඳ කුටි වෙනත් පුද්ගලයකුට විකිණීමට, බදු දීමට හෝ අයිතිය පැවරීමට නීතිමය අවසරයක් තිබේද;

(ii) මෙම වෙළඳ කුටිවල මේ වනවිට ව්‍යාපාර කටයුතු කරනු ලබන්නේ මීනුවන්ගොඩ නගර සභාව සමඟ ගිවිසුම්ගත වෙමින් එම වෙළඳ කුටි ලබා ගත් පුද්ගලයන්මද;

(iii) නොඑසේ නම්, මේ වනවිට එම වෙළඳ කුටිවල ව්‍යාපාර කටයුතු කරනු ලබන පුද්ගලයන්ගේ නම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

(iv) එම පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

864/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) එම අමු තේ දළු, නිමි තේ ලෙස නිෂ්පාදනය කිරීමේදී, වැදගත් කාර්යයක් තේ කර්මාන්තශාලා තුළ දී ඉටු කරනු ලබන බව පිළිගන්නේද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති ලියාපදිංචි තේ කර්මාන්තශාලා සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කර්මාන්තශාලා, අදාළ භූමිය තුළ භෞතිකව සත්‍ය වශයෙන්ම පිහිටා ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ බව ස්ථානීය පරීක්ෂණයක් මඟින් තහවුරු කර ගෙන තිබේද,

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vii) කවර හෝ හේතුවක් මත, ඉහත තේ කර්මාන්තශාලා/කර්මාන්තශාලාවක් මේ වනවිට නිමි තේ නිෂ්පාදනයෙන් බැහැර වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජූනි 19 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

13/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නැංවීම සඳහා සුවිශේෂ දායකත්වයක් සපයන ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල පහසුකම් වැඩිදියුණු කිරීම අතිශය වැදගත් බව පිළිගන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ ඇති ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සංඛ්‍යාව කොපමණද;

(iii) එම විද්‍යා පීඨ සඳහා අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) එම අනධ්‍යාන කාර්ය මණ්ඩලවල එක් එක් තනතුරට හිමි වැටුප් හා දීමනා සහ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සැලසුම් කර තිබේද;

(vi) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

76/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව මහ නගර සීමාවට අයත් ප්‍රදේශවල සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල ප්‍රතිසංස්කරණය කළ යුතු සහ අලුතින් ස්ථාපිත කළ යුතු ජලාපවහන පද්ධති පවතින බව දන්නේද;

(ii) එසේ නම්, පවතින ජලාපවහන පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට සහ නව ජලාපවහන පද්ධති ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

113/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මගී ප්‍රවාහනය තුළින් හා භාණ්ඩ ප්‍රවාහනය තුළින් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

215/2024

ගරු රෝහණ බංඩාර මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඊ.පී.එස්. වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ සෘතුමය රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ඒ සඳහා යම් බාහිර පාර්ශ්වයක් මැදිහත් වී ඇති බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් දකුණු කොරියාවේ රැකියා අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකිකයන් අපහසුතාවයට පත් වී ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

720/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පානීය ජල ගැටලුවට මුහුණ දී ඇති මොනරාගල දිස්ත්‍රික්කයේ ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) මොනරාගල දිස්ත්‍රික්කයේ මේ වනවිට ක්‍රියාත්මක කර ඇති ප්‍රජාමූල ජල ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අතරින් මේ වනවිට සාර්ථකව ක්‍රියාත්මක වන ප්‍රජාමූල ජල ව්‍යාපෘති කවරේද;

(v) මොනරාගල දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ප්‍රජාමූල ජල ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නාගරික සංවර්ධන අධිකාරියේ කාර්යාලයක් මොනරාගල ස්ථාපිත කර තිබූ නමුත්, එම කාර්යාලය මේ වනවිට ඉවත් කර ඇති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් මොනරාගල ප්‍රදේශයේ ජනතාවට අදාළ සේවා ලබා ගැනීම සඳහා බදුල්ලට හෝ කතරගමට යාමට සිදු වීමෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත් වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, නාගරික සංවර්ධන අධිකාරියේ කාර්යාලයක් මොනරාගල නැවත ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

855/2025

ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි සී කලාපයේ අක්කර 1000ක පමණ විශාලත්වයකින් යුතු ඉඩමක් ආයෝජන ව්‍යාපෘතියක් සඳහා ඉන්ෆොමැටික් පුද්ගලික සමාගමට බැහැර කර ඇති බවත්;

(ii) එම ඉඩමේ පළමු බදු කාලය අවසන් වී දෙවන බදු කාලය සඳහා බදු අනුමතිය ලබා දීමේදී, තක්සේරු කර ඇති මුදල වැඩි බැවින් බදු සහනයක් ලබා දී ඇති අතර එමඟින් රජයට විශාල බදු මුදලක් අහිමි වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි බදු සහනයක් ලබා දිය හැකිද;

(ii) එම බදු සහනය ලබා දීමේ පදනම කවරේද;

(iii) එය සංශෝධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

916/2025

ගරු වන්දන තෙන්නකෝන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 472, පොතුවිල ග්‍රාම නිලධාරි වසමේ අක්කර 76ක ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ නියමු ව්‍යාපෘතියකට 1999දී අත්පත් කරගෙන ඇති බව දන්නේද;

(ii) ඒ වෙනුවෙන් කොමිෂන් සභාවට ගෙවූ වන්දි මුදල, පොලී මුදල හා මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉඩම අත්පත් කරගැනීමට ඉල්ලීම් කළේ කවුරුන්ද;

(iv) ඉඩම අත්පත් කරගැනීමෙන් පසු භුක්තිය භාර දුන්නේ කාහටද;

(v) එම කෘෂිකර්ම නිෂ්පාදන නියමු ව්‍යාපෘතිය කවරේද;

(vi) එම ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විශාල ප්‍රාග්ධන වියදමක් දරා ඇති බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අත්පත් කරගත් ඉඩම, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් 'හිරියාල ගොවිජන සමාගමට' වර්ෂ 30කට අර්ධ කාලීන බදු පදනම මත ලබා දී ඇති බව දන්නේද;

(ii) එම සමාගම ගෙවිය යුතු වාර්ෂික බදු මුදල කොපමණද;

(iii) ඉහත සමාගමේ සභාපති කවුරුන්ද;

(iv) මෙහිදී රජයේ මුදල්/දේපළ අවභාවිතා කර ඇති බව පිළිගන්නේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

918/2025

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරයේදී ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ ඉන්දීය අග්‍රාමාත්‍යවරයා අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව, ඉන්දීය රජයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක කිරීමට නියමිත සියලුම අනුමත ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

(ii) ඉහත එක් එක් ව්‍යාපෘති හඳුනාගෙන අනුමත කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාවලිය, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘති හඳුනාගැනීමේ ක්‍රියාවලියේදී අදාළ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් විමසන ලද්දේද;

(iv) එසේ නම්, අදහස් ලබාගන්නා ලද පුද්ගලයින්ගේ/අස්ථිත්වයන්ගේ නම් සහ අනෙකුත් අදාළ තොරතුරු කවරේද?

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

922/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය කොපමණද;

(ii) අවසන් වරට රතු දත්ත පොත නිකුත් කර ඇති වර්ෂය කවරේද;

(iii) ඒ අනුව ශ්‍රී ලංකාවේ වනඅලින් සම්බන්ධ තර්ජන මට්ටම කවරේද;

(iv) 2024 වර්ෂය තුළ අලි-මිනිස් ගැටුම හේතුවෙන් මියගිය වනඅලින් සංඛ්‍යාව හා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අලි-මිනිස් ගැටුම හේතුවෙන් මියගිය පුද්ගලයන් හා සිදු වූ දේපළ හානි වෙනුවෙන් 2024 වර්ෂයේදී ගෙවා ඇති වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

925/2025

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් වැලිසර ගබඩා සංකීර්ණය පිහිටි ඉඩමේ කොටසක්, වත්තල උසාවි සංකීර්ණයේ නීතිඥයන්ට කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම සඳහා වෙන් කර ඇති බව දන්නේද;

(ii) එම ඉඩම් කොටස් වෙන් කර දී ඇති ක්‍රමවේදය කවරේද;

(iii) වත්තල නීතිඥ සංගමය විසින් එම ඉඩම් කොටස මේ වනවිට වාහන ගාල් කිරීම සඳහා වෙනත් පුද්ගලයෙකුට කුලියට ලබා දී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) අදාළ බිම් කොටස සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජුනි 20 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

159/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ සිට මේ දක්වා පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් වූ සිසුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සිසුන් අතරින් අඩු ආදායම්ලාභී සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) දරුවන්ට සහ දෙමාපියන්ට අගතියක් නොවන ආකාරයට ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඊට අදාළ වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරියේදී පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අත්හිටුවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය අත්හිටුවනු ලබන දිනය කවරේද;

(iii) එම විභාගය අත්හිටුවීමට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

192/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති ආයතනවලට ලැබුණු මූල්‍ය ආධාර හා මූල්‍ය නොවන ආධාර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික විගණන කාර්යාලයේ වාර්තාවට අනුව ඒවා නිවැරදි ලෙස ගිණුම්ගත කර නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

224/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් සුහුරු අධිකරණ ශාලා පිහිටුවීමට පොරොන්දු වී තිබේද;

(ii) ඒ අනුව මේ වනවිට සුහුරු අධිකරණ ශාලා බවට පත් කරන ලද අධිකරණ කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය, සුහුරු අධිකරණ පද්ධතියක් බවට පත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද:

(iv) ඒ වෙනුවෙන් 2025 වර්ෂයට අදාළ විසර්ජන පනත මඟින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

280/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල්වලට නිවාස ලබා දීම සඳහා වැඩපිළිවෙළක් යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iv) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

310/2024

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අලෙවි මණ්ඩලය ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(ii) එම මණ්ඩලය විසින් පසුගිය වර්ෂ 3 තුළ එක් එක් දිස්ත්‍රික්කයෙන් මිලට ගන්නා ලද වී තොග ප්‍රමාණය සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් දිස්ත්‍රික්කය තුළ වී මිලට ගැනීම සඳහා ස්ථාපිත කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් එක් දිස්ත්‍රික්කය තුළ ඇති වී ගබඩා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එක් එක් දිස්ත්‍රික්කයේ මුළු වී අස්වැන්නෙන් රජය විසින් වාර්ෂිකව මිලට ගනු ලබන වී ප්‍රමාණයෙහි ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 3 මුළුල්ලේ රාජ්‍ය බැංකු විසින් කුඩා හා මහා පරිමාණ වී මෝල් හිමියන් වෙත සපයා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අදාළ කාලපරිච්ඡේදය තුළ එම මෝල් හිමියන් විසින් මිලට ගන්නා ලද වී ප්‍රමාණය කොපමණද;

(iii) එම මෝල් හිමියන්ගේ නම් සහ ඔවුන් විසින් ඉහත දක්වන ලද කාලපරිච්ඡේදය තුළ මිලට ගන්නා ලද වී තොගවල ප්‍රමාණය හා වටිනාකම කොපමණද;

(iv) වී සහල් බවට පත්කර බෙදා හරිනු පිණිස ක්‍රමවේදයක් දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කරන්නේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

442/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවය කරනු ලබන වැඩ බලන විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩ බලන විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) වැඩ බලන විදුහල්පතිවරුන් උසස් කිරීමට පසුගිය රජය විසින් ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග වර්තමාන රජය විසින් ක්‍රියාත්මක කරන්නේද;

(iv) වැඩ බලන විදුහල්පතිවරුන්ට ස්ථිර පත්වීම් ලබා දෙන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

457/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිහිටුවා ඇති අන්තර් හුවමාරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ගයේ ගැලණිගම අන්තර් හුවමාරුවේ සිට දොඩන්ගොඩ අන්තර් හුවමාරුව දක්වා ඇති දුර කොපමණද;

(iii) පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකිරීම සඳහා මේ වනවිට ඉඩම් අත්පත් කර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල කොපමණද;

(v) පැල්පොල අන්තර් හුවමාරුව වෙනත් ස්ථානයක ඉදිකිරීමට අදහස් කර තිබේද;

(vi) එසේ නම්, ඊට හේතු කවරේද;

(vii) ඒ සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

587/2025

ගරු අජිත් ගිහාන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක්ස්ප්‍රස් පර්ල් (X-Press Pearl) නෞකා අනතුර හේතුවෙන් ශ්‍රී ලංකාවේ බටහිර මුහුදු කලාපයට මෙන්ම සමස්ත සාගර පරිසරයට, මුහුදු ජීවීන්ට සහ ධීවර ප්‍රජාවට විශාල හානියක් සිදු වූ බව දන්නේද;

(ii) එම අනතුරට අදාළ සිද්ධියේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම අනතුර හේතුවෙන් ධීවර කර්මාන්තයට සිදු වූ හානිය සහ පාරිසරික වශයෙන් සිදු වූ හානිය තක්සේරු කර තිබේද;

(iv) එසේ නම්, එම එක් එක් හානිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම හානි වෙනුවෙන් වන්දි ලබා දී තිබේද;

(vi) එසේ නම්, ලබා දෙන ලද වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

620/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවට සුදුසු ආයෝජකයෙකු සම්බන්ධ කර ගනිමින් ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නව තෙල් පිරිපහදුවක් පිහිටුවීමේ හැකියාව සොයා බලන ලෙසට අමාත්‍ය මණ්ඩලය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට උපදෙස් ලබා දුන් දිනය කවරේද;

(ii) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නව තෙල් පිරිපහදුවක් ඉදිකිරීම සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරියේදී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

924/2025

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් ගෙවීමේ පදනමින් පෞද්ගලික සහ ව්‍යාපාරික කටයුතුවල ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින්, රථ වාහන සහ වෙනත් සම්පත් ලබා ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අදාළ නීතිමය ප්‍රතිපාදනය කවරේද;

(iii) ඊට අදාළ කාර්ය පටිපාටිය කවරේද;

(iv) පොලිස් නිලධාරින් සහ රථ වාහන ලබා දීමේදී උපරිම සීමාවක් පනවා තිබේද;

(v) ඉහත (i)හි සඳහන් සේවාවන් ලබා දීමේදී මුදල් අයකිරීමේ ක්‍රමවේදය කවරේද;

(vi) 2024 වර්ෂයේ සහ 2025 වර්ෂයේ මේ දක්වා එලෙස සේවා සැපයීමෙන් ශ්‍රී ලංකා පොලිසිය උපයන ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i)හි සඳහන් සේවාවන් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරනු ලබන පාර්ශ්වය සම්බන්ධයෙන් සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(ii) එම පාර්ශ්වයට යම් තර්ජනයක් තිබේදැයි ආරක්ෂක විශ්ලේෂණ වාර්තා කැඳවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?